ආ) මිලදී ගැනීමට විශේෂිත ආයාසයක් දරන භාණ්ඩ ......**විශේෂිත භාණ්ඩ**...... වන අතර පාරිභොගිකයාගේ පාර්ශවයෙන් ඒ සඳහා එම භාණ්ඩයට ......**ආදේශන**...... නොමැත.

38. ආ) කිසියම් ශිල්පීය වෘත්තිකයන් සඳහා බඳවා ගත් නව සේවකයෙකු ගත කළ යුතු වෘත්තීය පුහුණු කාලය ආධුනික කාලය වේ.

ආ) වෘත්තීය ජීවිත කළමනාකරණය තුලින් සේවකයන්ට සිය හැකියාවන් සහ අපේක්ෂාවන් පිළිබඳව හොඳ අවබෝධයක් ලබාගැනීමෙන් සංවර්ධනයටත් හැකියාවන් ලැබේ.

39. අ) තොරතුරු පද්ධතියක තිබෙන සියළුම භෞතික කොටස් දෘඩාංග වන අතර ඒවායෙන් ප්‍රයෝජන ගත හැක්කේ මෘදුකාංග මගිනි.

ආ) පරිසරයේ හෝ සංවිධානයක සිදුවන නොයෙකුත් සිදුවීම මගින් හා ව්‍යාපාරික ගනුදෙනු මගින් ජනිත වන මූලික කරුණු හා සංඛ්‍යා දත්ත ලෙස හැඳින්වේ.

40. අ) ව්‍යාපාර සැලැස්මක මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය තොරතුරු වෙනුවට ඇතුලත් කර ඇත්තේ ඇස්තමේන්තුගත තොරතුරුය.

ආ) ව්‍යවසායකයෙකු තුල ඇතිවන ව්‍යාපාර සිතුවිලි සාර්ව හා සූක්ෂම විශ්ලේෂකාරයන් පසු ව්‍යාපාර අවස්ථාව තීරණය කළ යුතුය.

41. ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාරවලට දායක විය හැකි ආකාර හතරක් දක්වන්න.

- වෙනස්වන සංකීර්ණ වුවමනා සපාරාලීම
- නවෝත්පාදන
- රැකියා උත්පාදනය
- ජාතික ආර්ථිකය සංවර්ධනය

42. පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ඉදිරිපත් කර ඇති පාරිභෝගික අයිතිවාසිකම් නම් කරන්න.

- මූලික අවශ්‍යතා සපුරාගැනීමට ඇති අයිතිය
- වන්දි ලබාගැනීමට ඇති අයිතිය
- පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
- සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය

43. සීමා සහිත පොදු සමාගමවල වාසි හතරක් ලියන්න.

- විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකිවීම
- මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ හැකිවීම
- දක්ෂ කළමනාකරුවන් බඳවා ගෙන ව්‍යාපාර කටයුතු කර ගෙන යා හැකි වීම
- ඉහළ මට්ටමක මානව සම්පත් ඒකරාශී කරගත හැකි වීම.
- ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කළ හැකිවීම.

44. බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාර්යයන් හතරක් ලියන්න.

- කුලී පිට ගැනුම් පහසුකම සැපයීම.
- දේපල හා ඉඩම් වෙළඳාම් කිරීම.
- කල්බදු මූල්‍යකරණය
- කෙටිකාලීන ණය සැපයීම
- රජයේ සුරැකුම්පත්වල ආයෝජනය
- කාලීන තැන්පතු භාර ගැනීම.

45. විද්‍යුත් වෙළඳාමේ ක්‍රියාපටිපාටිය ලියන්න.

- අන්තර්ජාලය ඔස්සේ ගැනුම් කරුවන් හා විකුනුම්කරුවන් මුණගැසීම.
- වෙළඳ ගනුදෙනුව සංවිධානය කර ගැනීම.
- භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදුවීම.
- ගනුදෙනුවට අදාල ගෙවීම් කටයුතු පියවීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

46. දෙපාර්තමේන්තුකරණය සිදුකළ හැකි පදනම් හතරක් ලියන්න.

ශ්‍රිතමය පදනම ............ නිෂ්පාදිත පදනම ............

ගනුදෙනුකරු පදනම ............ භූගෝලීය පදනම ............

මිතු පදනම ............ ක්‍රියාවලි පදනම ............

47. නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් ලියන්න.

නිෂ්පාදිතයේ ස්වභාවය ............ වෙළඳපල ප්‍රමාණය ............

යොදාගන්නා තාක්ෂණය හා අවශ්‍ය උපකරණ ............ දැරිය යුතු පිරිවැය ............

මිලදී ගැනීමේ රටාව ............ සම්පත් ලබාගැනීමේ පහසුව ............

48. අලෙවිකරණ හර සංකල්පයක් වන තරගකාරීත්වයේ මට්ටම් නම් කරන්න.

සන්නම් තරගකාරීත්වය ............ කර්මාන්ත තරගකාරීත්වය ............

ස්වරූප තරගකාරීත්වය ............ පොදු තරගකාරීත්වය ............

49. බාහිර මූල්‍ය සම්පාදන මාර්ග හා සැසඳීමේ දී අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි හතරක් ලියන්න.

පිරිවැය අඩුවීම. ............ ලබාගැනීමේ පහසුව ............

ආපසු ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති වීම. ............ ව්‍යාපාරයේ වගකීම වැඩි නොවීම. ............

විශේෂ කොන්දේසි යටත් වීමට සිදු නොවීම. ............

50. තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

වේගවත් බව ............ නිවැරදිතාව ............

නම්‍යශීලී බව ............ විශ්වාසවන්ත භාවය ............

ගුණාත්මකභාවය වර්ධනය ............ අඩු සේවක සංඛ්‍යාවක් ප්‍රමාණවත් වීම. ............

වැඩි තොරතුරු ප්‍රමාණයක් කළමනාකරණය කිරීම. ............ අඩු ඉඩකඩ ප්‍රමාණවත් වීම. ............

පිරිවැය අඩුවීම. ............

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) - පෙරහුරු පරීක්ෂණය 2025
**கல்வி பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) - மாதிரி தேர்வு 2025**

**ව්‍යාපාර අධ්‍යයනය II**
**உயிர்முறைமைகள் தொழினுட்பவியில் II**
**Business Studies II**

**66 S II**

**පැය තුනයි**
**மூன்று மணித்தியாலம்**

| | | |
|---|---|---|
| **අමතර කියවීම් කාලය** | : | **මිනිත්තු 10 යි** |
| **மேலதிக வாசிப்பு நேரம்** | : | **10 நிமிடங்கள்** |
| **Aditional Reading Time** | : | **10 Minutes** |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග** **අංකය**

**උපදෙස් :**

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු 12 කින් සහ ප්‍රශ්න 10 කින් සමන්විත වේ.
* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වන අතර කොටස් **දෙකට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස - ව්‍යුහගත රචනා (පිටු අංක 2-10)**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නොවන** බව ද සලකන්න.

**B කොටස - රචනා (පිටු අංක 11-12)**

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (66) ජෛවපද්ධති තාක්ෂණවේදය - II | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංක | ලැබූ ලකුණු |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| **එකතුව** | | |

| එකතුව | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |
| **සංකේත අංක** | |
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## A කොටස - ව්‍යුහගත රචනා

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

(1) ලිමත්, ටිමත් හා දමිත් මිතුරන් වේ. ලිමත් සෙල්ලම් බඩු නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක හවුල්කරුවෙකු වන අතර, අදාල කර්මාන්තය ජාත්‍යන්තර වෙළඳපල සඳහා සෙල්ලම්බඩු නිෂ්පාදනය කර අලෙවිකරයි. මේ සඳහා ඔහු විද්‍යුත් වාණිජ්‍ය උපයෝගී කර ගනී. ටිමත් නීතිය පිළිබඳව හා බදු උපදේශන කටයුතුවල නිරත වේ. දමිත් උක් වගාව සාර්ථක ලෙස කරගෙන යයි. නමුත ඔහු යම් ගැටලු කිහිපයකට වර්තමානයේ මුහුණ පා ඇත.

I අ) ව්‍යාපාර වර්ගීකරණයේ පදනමක් වන නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ගීරණය යටතේ මෙම සිද්ධිය ඇසුරින් නිදසුන බැගින් ලියා දක්වන්න.

**ප්‍රාථමික - උක් වගාව**

**ද්විතීක - සෙල්ලම් බඩු**

**තෘතීයික - නීතිය හා බදු උපදේශනය**

(ල. 03)

ආ) විද්‍යුත් වාණිජ්‍ය යන්න පැහැදිලි කරන්න.

**අන්තර්ජාලයා හරහා මිලදී ගැනීම් හා විකිණීම් කටයුතු කිරීම විද්‍යුත් වාණිජය වේ.**

(ල. 01)

II දමිත්ගේ ව්‍යාපාරයට වර්තමානයේ උදාවී ඇති ව්‍යාපාර අවස්ථා හා තර්ජන දෙක බැගින් ලියන්න.

**අවස්ථා**

- **දේශීය වෙළඳපොළ විවෘත වීම**
- **රජයෙන් සහන ලැබීම**
- **රජයේ අවධානය යොමු වීම**
- **උක් වගාව ආශ්‍රිතව විවිධ වර්ගයේ අතුරු නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ ඉල්ලුම ඉහළ යාම** **( කරුණු දෙකට ලකුණු 2)**

**තර්ජන**

- **උක් වගා කරුවන්ට ගෙවීම ප්‍රමාදවීම**
- **උක් වගාවන් රජයෙන් මිලදී ගැනීමේ ක්‍රමවත් වැඩසටහනක් නොතිබීම**
- **නවීන යන්ත්‍ර සූත්‍ර භාවිත නොකිරීම**
- **අතරමැදියන්ගෙන් එල්ලවනන බලපෑම** **( කරුණු දෙකට ලකුණු 2)**

(ල. 04)

III ආ) නිෂ්පාදිත වර්ග අනුව ලිමත්ගේ ව්‍යාපාරය හා ටිමත්ගේ ව්‍යාපාරය අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

**භාණ්ඩ**

- **භෞතික පැවැත්මක් ඇත(ස්පර්ශ කළ හැකිය)**
- **ගබඩා කළ හැකිය**
- **සමජාතීය වන පරිදි නිෂ්පාදනය කළ හැකිය**
- **සපයන්නාගෙන් වෙන් කළ හැකිය**

**සේවා**

- **භෞතික පැවැත්මක් නොමැත( ස්පර්ශ කල නොහැක)**
- **ගබඩා කළ නොහැකිය**
- **සපයන්නා අනුව වෙනස් වේ**
- **සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය** (කරුණු දෙකට ලකුණු 2)

(ල. 02)

ආ) ලිමත්ගේ ව්‍යාපාරය ඇසුරින් ප්‍රධාන ව්‍යාපාර කටයුතු දෙක නම් කරන්න.

- **සෙල්ලම් බඩු නිපදවීම මගින් මිනිස් අවශ්‍යතා උවමනා සපුරාලීම.**
- **සෙල්ලම් බඩු නිපදවීමට ගන්නා සම්පත් තුළ ස්වරූපය වෙනස් කිරීම මගින් සම්පත්වලට අගය එකතු කරයි.**

- ව්‍යාපාර කටයුතු දෙකේ නම් කිරීමට $\frac{1}{2} \times 2 =$ ල. 1

- සිද්ධිය ඇසුරෙන් ලිවීමට $\frac{1}{2} \times 2 =$ ල. 1

(ල. 02)

IV ආ) ලිමත්ගේ කර්මාන්තය මෙරට ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරයන් 4 ක ලියා දක්වන්න.

- **රැකියා අවස්ථා උදාකර දීම**
- **නවෝත්පාදනයන් බිහිකිරීම**
- **විදේශ විනිමය ඉපයීම**
- **වෙනස් වන සංකීර්ණ වුවමනා හඳුනා ගැනීම හා ඉටුකිරීම**
- **ජාතික ආර්ථික සංවර්ධනය**

(කරුණු හතරට ලකුණු 2)

(ල. 02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

ආ) උක් වගාකරුවන්ගේ ගැටළු සඳහා රජයට මැදිහත් විය හැකි ආකාර හතරක් සඳහන් කරන්න.

- උක් නිෂ්පාදනය සඳහා සාධාරණ මිලක් ලබාදීම සඳහා වැදගත් වීම
- වගාකරුවන් සඳහා නව තාක්ෂණ ක්‍රම හඳුන්වාදීම
- උක් වගාවන් සඳහා සහනාධාර පොහොර ආදිය ලබාදීම
- මූල්‍ය පහසුකම් සැපයීම

(ල. 02)

V අ) ලිමත්ගෙ ව්‍යාපාරය අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 4 ක් නම් කරන්න.

**Recycle** - ප්‍රතිචක්‍රීකරණය

**Reduce** - භාවිතය අඩු කිරීම

**Replace** - නැවත ස්ථාපිත කිරීම

**Reuse** - නැවත භාවිත කිරීම

(ල. 02)

ආ) ටිමත්ගේ ව්‍යාපාරයෙන් ලිමත්ට හා දමිත්ට ගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

- ව්‍යාපාරය පවත්වාගෙන යාම,පුළුල් කිරීම,ලියාපදිංචි කිරීම ආදිය සඳහා නීති උපදෙස් ලබා ගැනීම.
- ආදායම් වියදම් වාර්තා සකස් කිරීම,බදු නිදහස් කර ගැනීමට අදාළ උපදෙස් ලබා ගැනීම.

(ල. 02)

(2) වර්තමානයේ සංචාරක කර්මාන්තයේ සීඝ්‍ර දියුණුවක් දැකිය හැකිය. ඒ සමගම විදේශ ආයෝජනයෙන් සංවර්ධනයක් සිදු වුවහොත් රටේ සංවර්ධනයද වේගවත් කළ හැක.

I අ) විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමට රජයකට අනුගමනය කළ හැකි උපායමාර්ග 4 ක් සඳහන් කරන්න.

- විනිමය ප්‍රතිපත්ති ලිහිල් කිරීම
- නීති රීති ලිහිල් කිරීම
- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- නිදහස් වෙළඳ කලාප ඇති කිරීම
- බදු සහන බදු විරාම ලබාදීම
- විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම
- ජාත්‍යන්තර සම්බන්ධතා ඇතිකර ගැනීම (කරුණු හතරට ලකුණු 2)

(ල. 02)

ආ) ප්‍රමාණාත්මක ණය පාලනය සඳහා යොදාගත හැකි උපක්‍රම 2 ක ලියා දක්වන්න.

- **වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම**
- **ණයවර ලිපි නිකුත් කිරීමේදී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම**

කරුණු දෙකට ලකුණු 2යි

(ල. 02)

II වතුර බොතල් නිෂ්පාදනයේ යෙදීසිටින 'Pearl Water' ආයතනය සිය නිෂ්පාදිතය සඳහා SLS සහ ISO යන ප්‍රමිති සහතික දෙක ලබාගැනීම සලකා බලමින් සිටී.

අ) මෙම ප්‍රමිති දෙකෙහි ඔබ දකින වෙනස්කම කුමක්ද?

**SLS**

**මෙම සහතිකරනය මගින් ශ්‍රී ලංකා ප්‍රමිති වලට අනුකූලව බවන්ට නිෂ්පාදනය කර ඇති බවට තෙවන පාර්ශව සහතික කිරීම සිදුවේ මෙය නිෂ්පාදිත සහතික කිරීමකි.**

**ISO**

**තත්ත්ව කළමනාකරණ පද්ධති සහතික කිරීමකි මෙය සමස්ත ව්‍යාපාර පද්ධතියම ආවරණය වන ලෙස සකස් කර ඇති ජාත්‍යන්තර ා වසයෙන් පිළිගන්නා ප්‍රමිති සහතික ක්‍රමයකි.**

(ල. 02)

ආ) ඉහත ආයතනයට මෙම ප්‍රමිති සහතික ලබාගැනීමෙන් අත්වන වාසි කවරේද?

- **නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය ඉහළ යාම**
- **ප්‍රවර්ධනය පහසුවීම**
- **ප්‍රමිතියට අනුව නිපදවන බැවින් පිරිවැය අඩුවීම(අපතේ යාම හා නාස්තිය අඩුවීම)**
- **තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකිවීම හා වෙළඳපොළ තුළ රැඳී සිටීමේ හැකියාව ඉහළ යාම**
- **ආයතනයේ තත්ත්වය ප්‍රතිරූපය සහ විශ්වාසනීයත්වය වර්ධනය වීම**
- **ISO වැනි සහතිකකරණයන් ජාත්‍යන්තරව පිළිගැනෙන නිසා විදේශ වෙළෙඳපොළට පිවිසීමේ අවස්ථා උදාවීම**

(ල. 02)

III 'සංඛ' මුද්‍රණාලය රත්නපුර ප්‍රදේශයේ ඇති ජනප්‍රිය ව්‍යාපාර ආයතනයකි. දිගු කාලයක් ව්‍යාපාරික කටයුතුවල නියැලුණු ගුණපාල මුදලාලි ව්‍යාපාර පිළිබඳ මනා දැනුමක් ලබා ඇත. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය සමත්වීමෙන් පසු ගුණපාල මුදලාලිගේ පුත් සංඛ රැකියාවක් ලැබෙන තෙක් සිය පියාගේ ව්‍යාපාරික කටයුතුවලට උදවු කරයි. සංඛය සිය ව්‍යාපාර කටයුතු දියුණු කරගෙන සිටින ලෙස සියා යෝජනාවක් ගෙන එන අතර එයට එකඟ වන සංඛ සීමිත සමාගමක් ලෙස සංඛ මුද්‍රණාලය සංස්ථාපනය කළ යුතු බව අවධාරණය කරයි.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

අ) සංඛ මුද්‍රණාලය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්විය හැකිද?

කේවල ස්වාමී ව්‍යාපාරයකි

(ල. 01)

ආ) සීමිත සමාගමක් ලෙස සංඛ මුද්‍රණාලය පරිවර්තනය වීමට නම ලියාපදිංචි විය යුත්තේ කුමන පනත යටතේ කවුරුන් වෙතද?

2007 අංක 07 දරන සමාගම් පණත (ල. ½)

සමාගම් රෙජිස්ටාර්වරයා යටතේ (ල. ½)

(ල. 01)

ඉ) ඉහත සංඛ මුද්‍රණාලය සීමිත සමාගමක් බවට පත්කිරීමෙන් අත්වන වාසිදායක තත්ත්වයන් මොනවාද?

2007 අංක 07 දරන සමාගම් පණත (ල. ½)

සමාගම් රෙජිස්ටාර්වරයා යටතේ (ල. ½)

(ල. 02)

IV අ) ශ්‍රී ලංකාවේ 'සමූපකාර ව්‍යාපාරය' ක්‍රියාත්මත වන ආකාරය අනුව එහි හඳුනාගෙන හැකි ගැටලු 2ක් සඳහන් කරන්න.

- කළමනාකරණ දූර්වලතා ඇතිවීම
- සාමාජික ප්‍රමාණය අඩුවීම
- ප්‍රාග්ධන සම්පාදනය අඩුවේ
- සුදුසුකම් නොමැති පුද්ගලයන් කළමනාකරන්ට පත්වීම
- ස්වාධීනත්වය පිරිහීම හා දේශපාලනීකරණය වීම

(ල. 02)

ආ) වරලත් හිමියෙකු විසින් වරලත්ලාභියෙකු තොරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු 4 ක් ලියන්න.

- වරලත් ලාභියා පිළිබඳව ඇති විශ්වාසවන්තභාවය
- මූල්‍ය ශක්තිය
- වරලත් ලාභියාගේ යෙදවුම් පිළිබඳව දැනුම හා පලපුරුද්ද
- වරලත් ලාභියාගේ ප්‍රතිරූපය හා කීර්ති නාමය
- වෙනත් ශක්තීන් - ගබඩා,ප්‍රවාහන

(ල. 02)

V රාජ්‍ය අංශයට අයිති ව්‍යාපාර ආයතන අතුරින් රාජ්‍ය සමාගම් රාජ්‍ය සංස්ථවලට වඩා ව්‍යාපාර තරඟකාරීත්වයට මුහුණදිමට යෝග්‍ය වේ. මෙම ප්‍රකාශය තහවුර කිරීමට කරුණු 4 ක් ලියා දක්වන්න.

- මූල්‍ය නිදහස / ප්‍රාග්ධනය සපයා ගැනීමේ නිදහස
- තීරණ ගැනීමේ නිදහස
- රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි හා පරිපාලන රෙගුලාසි වලින් නිදහස් වීම

- සේවක ප්‍රතිලාභ නම්‍යශීලීව ලබාදිය හැකිවීම
- දේශපාලන බලපෑම් අවම වීම

(ල. 04)

(3) I අ) ව්‍යවසායකත්වය රටක සංවර්ධනයට අත්‍යවශ්‍ය වේ. ව්‍යවසායකත්වයේ වැදගත්කම් 2 ක් දක්වන්න.

ගුරු මාර්ග උපදේශ සංග්‍රහය පිටුව 111 අනුව (කරුණු දෙකට ලකුණු 1)

(ල. 01)

ආ) ව්‍යවසායකත්වය තුලින් අත්වන පුද්ගල, ආයතනික හා ආර්ථික ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න.

පුද්ගල ප්‍රතිලාභ

- පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථා ලැබීම
- ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකිවීම
- සමාජ තත්ත්වය හා පිළිගැනීම ඇතිවීම
- ආත්ම තෘප්තිය ලැබීම
- පුද්ගලික මූල්‍යමය ලාභ ලැබීම

(කරුණු දෙකට ලකුණු 1යි)

ආයතනික ප්‍රතිලාභ

- ව්‍යාපාර තරගකාරීත්වයට මුහුණ දීමට පහසුවීම.
- ව්‍යාපාර කටයුතු පුළුල්වීම
- අඛන්ඩව වර්ධනය වීම
- වෙළඳපොළ කොටස පුළුල් වීම
- කළමනාකරණය තුළ විශිෂ්ටයින් බවට පත්වීම

(කරුණු දෙකට ලකුණු 1)

ආර්ථික ප්‍රතිලාභ

- නව රැකියා අවස්ථා උත්පාදනය වීම
- ආදායම් අවස්ථා බිහිවීම
- නව භාණ්ඩ හා සේවා පාරිභෝජනයට අවස්ථාව උදාවීම
- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම
- ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම
- නව වෙළඳපොළවල් සංවර්ධනය වීම

(කරුණු දෙකට ලකුණු 1)

(ල. 03)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

II අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය සඳහා විවිධ නිර්නායක භාවිතා කරයි. එම නිර්නායක පදනම් වී ඇති ප්‍රධාන සාධක දෙක නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

<u>ප්‍රමාණාත්මක නිර්ණායක,</u>

සංඛ්‍යාත්මක වශයෙන් ගණනය කළ හැකි සාධකයන්ය. (ල. ½)

නිදසුන් : ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය,යොදාගන්නා සේවක සංඛ්‍යාව,භාවිතා කරන බලශක්ති ප්‍රමාණය , වාර්ෂික පිරිවැටුප, (නිදසුන් දෙකට ල.½)

<u>ගුණාත්මක නිර්ණායක</u>

සංඛ්‍යාත්මක වශයෙන් මැනිය නොහැකි සාධක (ල. ½)

නිදසුන් : <u>ව්‍යාපාර සංවිධාන ක්‍රමය,භාවිතා කරන තාක්ෂණය,වෙළඳපොළ ස්වභාවය</u> (නිදසුන් දෙකට ල. ½)

(ල. 02)

ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කර ටික කලකින් අසාර්ථක වන අවස්ථා බොහෝ විට දක්නට ලැබේ. එසේ වීමට හේතු හතරක් දක්වන්න.

- මූල්‍ය ගැටලු
- තරගකාරීත්වයට මුහුණ දීමට අපහසු වීම
- කළමනාකරණයේ දුර්වලතා
- ව්‍යවසායකත්ව හැකියා අඩුවීම
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
- තාක්ෂණික දැනුම අඩුකම හා දියුණු තාක්ෂණය යොදා නොගැනීම

(කරුණු හතරට ලකුණු 2)

(ල. 02)

III භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනම දෙයක් මුදල් වශයෙන් සලකයි.

අ) මෙහි සඳහන් ලක්ෂණයට අමතරව හොඳ මුදලක ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

- කල්පැවැත්ම
- අනුකරණයේ දුෂ්කරතාව
- පහසුවෙන් ගෙනයා හැකිවීම
- සමජාතීය බව
- කුඩා කොටස් වලට බෙදිය හැකිවීම

(කරුණු හතරට ලකුණු 2)

(ල. 02)

ආ) හුවමාරුවේ දී භාවිත වන ව්‍යවහාර මුදල් හා බැංකු මුදල් අතර වෙනස පැහැදිලි කරන්න.

- **ව්‍යාපාර මුදල් යනු මූල්‍ය අධිකාරියේ නියෝජනය මත නිකුත් කරන කාසි හා නෝට්ටු වන අතර බැංකු මුදල් යනු ජංගම ගිණුම් වල ඇති ශේෂයන් වේ.**
- **ව්‍යවහාර මුදල් කාසි හා නෝට්ටු මගින් ගනුදෙනු සිදු වේ. බැංකු මුදල් චෙක්පත් භාවිතා කරයි.**
- **ව්‍යවහාර මුදල් 100% ද්‍රවශීලතාවයක් ඇත. බැංකු මුදල්වල ද්‍රවශීලතාවය 100% නොමැත.**

(කරුණු දෙකට ලකුණු 2)

(ල. 02)

VI ධනංජය විසින් සිය ව්‍යාපාරය වෙනුවෙන් ණයක් ලබාගැනීම සහ අනෙකුත් පහසුකම් සපයා ගැනීමට බැංකු ගිණුමක් ආරම්භ කරන ලදී. නමුත් එම බැංකුවෙහි ජංගම ගිණුමක් ආරම්භ කිරීමේ හැකියාවක් නොමැති වීම ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවාසියකි.

අ) මහ බැංකු වාර්තා වර්ගීකරණයට අනුව මෙම ගිණුම ආරම්භ කර ඇත්තේ කුමන වර්ගයේ බැංකුවකද?

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

(ල. 01)

ආ) ඉහත සඳහන් කළ බැංකුව ණය සපයීම හැර ව්‍යාපාර ක්‍රියාකාරීත්වයට දායක වන ආකාර තුනක් සඳහන් කරන්න.

- **කාලීන හා ඉතිරි කිරීමේ තැන්පත් භාර ගැනීම**
- **සමාගම් වල කොටස් ප්‍රාරක්ෂණය කිරීම**
- **කල්බදු පහසුකම් සැපයීම**
- **කළමනාකරන උපදේශන සේවා සැපයීම**

(කරුණු තුනට ලකුණු 3)

(ල. 03)

V "ජගත්සිරි ලිපිකරුවෙකු ලෙස පුද්ගලික සමාගමක රැකියාවට බැඳී ලතවූ මුල් මාසයේ ඔහුගේ වැටුප ලැබුණේ 'චෙක්පතකිනි.' එහි ආදායකයාගේ ගිණුමට පමණයි ලංකා බැංකුව යනුවෙන් රේඛනය කර තිබූ අතර ඔහුට චෙක්පත් ගනුදෙනු පිළිබඳ දැනුමක් නොමැත."

අ) ඔහුට මෙම චෙක්පත මුදල් කරගත හැකි ආකාරය පිළිබඳ උපදෙස් දෙන්න.

**ලංකා බැංකු ශාඛාවක ඇති ජගත්සිරි ගේම ගිණුමක තැන්පත් කිරීම මගින් මෙම චෙක්පත මුදල් කර ගත හැකිය.**

(ල. 02)

ආ) මෙහි සඳහන් රේඛනයේ අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

**ආදායකයාගේ ගිණුමට පමණයි , ලංකා බැංකුව යනුවෙන් රේඛණය සඳහන් වීමේ අදහස වන්නේ, මෙම චෙක්පතෙහි නම සඳහන් පුද්ගලයාගේ ලංකා බැංකුවූ ශාඛාවක ඇති ගිණුමෙහි පමණක් මෙම චෙක්පත තැන්පත් කර මුදල් ලබාගත හැකි බවයි.මෙය පැවරීම සීමා කෙරෙන රේඛණයකි.**

(ල. 2 )

(4) I රක්ෂණය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට රක්ෂණ මූලධර්ම අනුගමනය කළ යුතුය.

අ) එසේ අනුගමනය කළ යුතු රක්ෂණ මූලධර්ම නම් කරන්න.

**රක්ෂණ හිමිකම, උපරිම විශ්වාසය, හානි පූරණය, ආදේශනය, දායකත්වය, ආසන්නතම හේතුව.**

(කරුණු හයට ලකුණු 2, කරුණු තුනට ලකුණු 1, කරුණු දෙකට ලකුණු 1/2)

(ල. 02)

ආ) 'ඇතැම් රක්ෂණ මූලධර්ම ජීවිත රක්ෂණය සඳහා බල නොපායි' එම මූලධර්ම සඳහන් කර එසේ වීමට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

**හානිපූරනය,ආදේශනය,දායකත්වය** (ලකුණු ½)

**මෙම මූලධර්ම ජීවිත රක්ෂණයට අදාල නොවේ. එයට හේතුව වන්නේ ජීවිත හානි වීමෙන් හෝ අනතුරට පත්වීමෙන් වන හානිය මුදලින් මැනිය නොහැකිවීමත් එයා යථා තත්ත්වයට පත් කළ නොහැකි වීමත්ය. ජීවිත රක්ෂණයේදී ඔප්පුවේ සඳහන් යම් නිශ්චිත වටිනාකමක් වන්දි වශයෙන් ප්‍රධානය කෙරේ.**

(තොරතුරු ඇතුළත් සම්පූර්ණ පිළිතුරකට ලකුණු 2)

II අ) "ලිඛිත සන්නිවේදනයට සාපේක්ෂව වාචික සන්නිවේදනය සඵලදායි වේ." එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**එකඟ වේ නම් හේතු,**

**ලිඛිත සන්නිවේදනයට සාපේක්ෂව වාචික සන්නිවේදනයේදී**

- **ගැටලුව වඩාත් විස්තරාත්මකව ඉදිරිපත් කළ හැකිය.**
- **තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වේ.**
- **තොරතුරු ඉතා ඉක්මනින්ම රහසිගතව ඉදිරිපත් කළ හැකිය.**

(කරුණු දෙකට ලකුණු 2)

**එකඟ නොවේ නම් හේතු,**

- **වාචිකමය දුර්ලතා ඇති පාර්ශව සමග තොරතුරු හුවමාරුව ගැටලු සහගතු සහගත වීම.**
- **තොරතුරු සන්නිවේදනය කළ බවට සාක්ෂියක් නොමැත.**

(කරුණු දෙකට ලකුණු 2)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ආ) ප්‍රවාහනය යනු මාධ්‍යයක පමණක්ම නොවේ. මූලිකාංග කිහිපයක එකතුවකි. ප්‍රවාහනයේ මූලිකාංග නම් කර කෙටියෙන් හඳුන්වා උදාහරණ සපයන්න.

**මාර්ගය - ප්‍රවාහනීය සඳහා භාවිතාකරන විවිධ මාර්ග වේ .**

**නිදසුන්: මහා මාර්ග,දුම්රිය මාර්ග......**

**මාධ්‍යය - විවිධ මාර්ගවල ධාවනය වන විවිධ වාහන වර්ග වේ.**

**නිදසුන් : සඳහන් කර තිබිය හැකිය.**

**බලය - එක් එක් මාධ්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ඉන්ධන වර්ගය හෝ ශක්තිය වේ.**

**නිදසුන් : විවිධ නිදසුන් දැක්විය හැකිය**

**පර්යන්තය - ප්‍රවාහන මාධ්‍ය ප්‍රවාහන කාර්යයේදී නවතා තබන නැවතුම්පොළවල් වේ.**

**නිදසුන් : විවිධ නිදසුන් දැක්විය හැකිය.**

(කරුණු දෙකට ලකුණු 2)

III ආ) ගබඩාවක භාණ්ඩ ඇසිරීම් කළ හැකි ආකාර හතරක් නම් කරන්න.

**තට්ටු ඇසුරුම් ක්‍රමය,**

**භාණ්ඩ ගොඩවල් වශයෙන් හැසිරීම**

**එහා මෙහා කළ හැකි තට්ටු සහිත රාමු**

**තල්ලු කරන රාක්ක**

**තට්ටු දෙකක් අතර ඇති අමතර තට්ටුව**

**ස්වයංක්‍රීයව ඇසුරුම් ක්‍රම**

(කරුණු දෙකට ලකුණු 2)

ආ) "පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි මෙන්ම අවාසිද දක්නට ලැබේ." භාණ්ඩ බෙදාහැරීම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න.

**වාසි**

- **විවිධ නිෂ්පාදකයින් නිපදවන භාණ්ඩ හා සේවා ලබාගෙන අවශ්‍ය වෙලාවට පහසු ස්ථානයකදී ලබාදීමට කටයුතු කිරීම.**
- **නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීම පහසුවීම**
- **වෙළඳපොළ තොරතුරු අදාළ පාර්ශවයන්ට පහසුවෙන් ලබාගත හැකි වීම**
- **හුවමාරු ක්‍රියාවලිය සරලවීම**

**අවාසි**

- **වෙළඳපොළ තුල අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇතිවීම**
- **භාණ්ඩවල මිල ගණන් ඉහළ යා හැකිවීම**

(ල. 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

VI අ) "අන්තරාල වෙළඳාමට සාපේක්ෂව ප්‍රති අපනයනය රටකට වැදගත් වේ." එසේ වීමට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

**ප්‍රතිඅපනයනයේ දී ආනයනය කරන ලද භාණ්ඩ රට තුළට ගැනවිත් වෙනසකට භාජනය කෙරෙන නිසා,**

- **රට තුළ නව රැකියා අවස්ථා නිර්මාණය වේ**
- **යටිතල පහසුකම් සංවර්ධනය වේ**
- **නව ව්‍යාපාර කර්මාන්ත බිහිවේ**
- **වෙළඳපොළ කටයුතු පුළුල් වේ**
- **විදේශ වෙළඳ සබඳතා පුළුල් වේ**
- **විදේශ විනිමය රට තුළට ගලා ඒම සිදු වේ.**

(සුදුසු කරුණු ලියා ඇත්නම් කරුණු හතරකට ලකුණු 2)

ආ) පහත ලියවිලි විදේශ වෙළඳාමේදී වැදගත් වන ආකාරය සඳහන් කරන්න.

A) නෞභරපත
**ආනයනකරුට තම භාණ්ඩවල අයිතිය තහවුරු කිරීමට**

B) ඉන්වොයිසිය
**අපනයනය කරන ලැබූ භාණ්ඩවල විස්තර දැන ගැනීමට.**

C) ප්‍රාභවස්ථාන සහතිකය
**තීරු බදු සහන ලබා ගැනීමට**

D) ණයවර ලිපිය
**අපනයනය කරනු ලැබූ භාණ්ඩ සඳහා මුදල් ගෙවීම තහවුරු කර ගැනීමට.**

(ල. 02)

V අ) රටක් විදේශ වෙළඳාමේ නිරත වෙමින් අත්වන ප්‍රතිලාභ 4 ක් සඳහන් කරන්න.
**ගුරු මාර්ග උපදේශයේ පිටු අංක 221 අනුව ලකුණු ලබාදෙන්න.**

(ල. 02)

ආ) නිදහස් වෙළඳාම යන්න හඳුන්වා නිදහස් වෙළඳාමට ඇති බාධා දෙකක් සඳහන් කරන්න.

**කිසිදු බාධාවකින් තොරව විවිධ පාර්ශ්වයන්ට නිදහසේ භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයන් පැවතීම,**

- **තීරු බදු බාධා**
- **ආනයන සීමා කිරීම්/ පංගු කිරීම්**
- **අපනයන සීමා කිරීම් / පංගු කිරීම්**
- **වෙළඳ ගිවිසුම්**
- **දැඩි විනිමය ප්‍රතිපත්ති**

ල. 02)

(5) ජානකී සමරනායක ඇඟලුම් නිෂ්පාදන ආයනයක හිමිකාරියකි. අනාගතයේ ඇයගේ ව්‍යාපාර කටයුතු සුදුසුකම් ලත් කළමනාකරණ මණ්ඩලයක් මගින් ඉටු කරවා ගැනීමට බලාපොරොත්තු වේ. ව්‍යාපාරය මහා පරිමාණ මට්ටම දක්වා පුළුල් කර ගැනීමේ අදහස ඇති නිසා විවිධ මට්ටම්වල කළමනාකරුවන් බඳවාගෙන ඉතා කාර්‍යක්‍ෂමව කටයුතු කරමින් ඇයගේ අරමුණු ඉටුකරවා ගැනීමට බලාපොරොත්තු වේ. ඇය වෙනුවෙන් ව්‍යාපාරය පිළිබඳ සාර්ථක තීරණ ගැනීමේ හැකියාවද ඔවුන් සතු විය යුතු බවත් කළමනාකරණ ක්‍රියාවලිය සාර්ථකව ඉටුකිරීමට ඔවුන්ට හැකිවිය යුතු බවත් ඇයගේ අදහසය.

I අ) "කළමනාකරු" යනු කවරෙක්ද?

**සංවිධානයක පරමාර්ථ හා අරමුණු ළඟා කර ගැනීම සඳහා සැලසුම්කරණය,සංවිධානකරණය,මෙහෙයවීම හා පාලනය කරනු ලබන්නා කළමනාකරුවා වේ.මොහු කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ සම්පත් කාර්යක්ෂම හා සපලදායිව උපයෝජනය කරයි.**

(ල. 02)

ආ) ජානකීගෙ ව්‍යාපාරයට කළමනාකරණයේ වැදගත්කම සිදධියේ ඇති කරණු හතරක දක්වමින් පැහැදිලි කරන්න.

- **ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට**
- **ආයතනය පුළුල් වීමත් සමග ඒවායේ කටයුතු සංකීර්ණ භාවයට පත්වන බැවින් එම තත්ත්වයට සාර්ථකව මුහුණ දීමට**
- **සීමා සහිත සම්පත් කාර්යක්ෂම හා සපලදායිව යොදාගැනීමට**
- **නිවැරදි තීරණ ගැනීමට**
- **ඇල්ම ඇති පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටු කිරීමට**

(ල. 02)

II අ) කළමනාකරුවෙකුගේ භූමිකා අතරින් සිදධියෙන් හඳුනාගත හැකි භූමිකාව සඳහන් කර එහි උපභූමිකා සඳහන් කරන්න.

**තීරණ භූමිකාව - ව්‍යවසායකත්වය, බාධා පාලනය කරන්නා, සම්පත් වෙන්කර දෙන්නා, සාකච්ඡා කරන්නා**

(එක් කරුණකට ½ බැගින් × 4 = 2)

ආ) ජානකී වෙනුවෙන් කටයුතු කිරීමට බඳවා ගත හැකි කළමනාකරුවන් වර්ග බලතල හෙවත් අධිකාරිය අනුව වර්ග කර ඒ ඒ මටටම් සඳහා නිදසුන බැගින් දක්වන්න.

**අග්‍ර කළමනාකරුවන් : සභාපති, ප්‍රධාන විධායක නිලධාරී.**

**මධ්‍ය කළමනාකරුවන්: නිෂ්පාදන කළමනාකරුවන්**

**අලෙවි කළමනාකරුවන්**

**මූල්‍ය කළමනාකරුවන්**

**මානව සම්පත් කළමනාකරුවන්**

**පහළ හෙවත් පසු පෙළ කළමනාකරුවන් - වැඩ මූලික, සුපර්වයිසර්**

(ල. 02)

III ආ) තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී හොඳම විකල්පය තේරීමෙ දී අවධානය යොමුකළ යුතු කරුණු හතරක් දක්වන්න.

**විකල්ප පිළිගත හැකි බව, පිරිවැය දැරිය හැකි බව,නීත්‍යානුකූල බව, සදාචාරාත්මක බව, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි බව.**

(ල. 02)

ආ) ව්‍යාපාර කටයුතු සංවිධානයකරණයේ දී ඇති විය හැකි දුර්වලතා හතරක් සඳහන් කරන්න.

- **කාර්යයන් නිසි ලෙස හඳුනා නොගැනීම**
- **දෙපාර්තමේන්තුකරණය යෝග්‍ය නොවීම**
- **අධිකාරියේ ප්‍රමාණවත්ව නොපැරවීම**
- **සම්පත් නිසි පරිදි බෙදා නොහැරීම**
- **නිසි අන කිරීමේ ධුරාවලියක් නොතිබීම**
- **පාලන අවකාශයේ යෝග්‍ය නොවීම**
- **නිසි සමායෝජනයක් නොවීම**
- **නියෝග දීමේ දාමයක් නොතිබීම**

(ල. 02)

IV ආ) ජානකිගේ අරමුණු ඉටුකර ගැනීමට පාලන ක්‍රියාවලිය කොතරම් වැදගත් වේද යන්න කරුණු හතරකින් පැහැදිලි කරන්න.

- **නිෂ්පාදනයේ ගුණත්වය ආරක්ෂා කර ගත හැකි වීම.**
- **පිරිවැය අවම කර ගත හැකි වීම**
- **වැරදි අවම කර ගැනීමට හෝ ශූන්‍ය මට්ටමට ගෙන ඒමට හැකිවීම**
- **පරිසරයේ වෙනස් වීම් වලට ගැලපීමට**
- **ආයතනයේ ප්‍රගතිය නිරීක්ෂණයට**
- **ආයතනයේ කාර්ය සාධනය අපේක්ෂණ මට්ටමට සිදුවේද යන්න සොයා බැලීමට.**

(ල. 02)

ආ) පාලනය සඳහා යොදාගන්නා ශිල්ප ක්‍රමයක් වන ඉදිරි පෝෂණ පාලනය යන්න හඳුන්වා ඒ සඳහා කළමනාකරුවන්ට ගත හැකි ක්‍රියාමාර්ග සඳහා නිදසුන් සපයන්න.

**ආයතනයක ඉදිරියේදී ඇතිවිය හැකි අහිතකර වූ ප්‍රතිඵල ඇතිවිට හා එයින් අනාගතයේ කාර්ය සාධනයට ඇතිවිය හැකි හානි වලක්වා ගැනීම පිණිස ගනු ලබන පාලනය.**

**නිදසුන් : යන්ත්‍ර නිවැරදිව නඩත්තු කිරීම හා ක්‍රියාත්මක කිරීමට පෙර පරීක්ෂාව සේවකයින් පුහුණු කිරීම**

(ල. 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

V අ) බිස්කට් නිෂ්පාදන ආයතනයකට යොදා ගත හැකි සුදුසුම නිෂ්පාදන ක්‍රමය කුමක්ද?

**ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමය**

(ල. )

ආ) එහි හිතකර ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

- **මහා පරිමාණ පිරිමැසුම් නිසා ඒකක පිරිවැය අඩුවීම**
- **අවශ්‍ය සේවක සංඛ්‍යාව අවම වීම**
- **නවීන තාක්ෂණය පහසුවෙන් යොදාගත හැකි වීම**

(ල. )

(6) නවීනතම තාක්‍ෂණය යොදාගනිමින් ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරයක් සහ අලෙවි සැලක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන සමීරට ඒ පිළිබඳ උපදෙස් අවශ්‍යව ඇත.

I අ) සමීර විසින් සුදුසු නිෂ්පාදන ක්‍රමයක් තෝරාගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 4 ක් දක්වන්න.

**නිෂ්පාදනයේ ස්වභාවය, වෙළඳපොළ ප්‍රමාණය, යොදාගන්නා තාක්ෂණය හා අවශ්‍ය උපකරණ, දැරිය හැකි පිරිවැය, මිලදී ගැනීමේ රටාව, සම්පත් ලබා ගැනීමේ පහසුව**

(ල. 02)

ආ) ඔහුගේ ව්‍යාපාරය සඳහා යොදාගත හැකි පිරියත සැලසුම් වර්ගයක් යෝජනා කර ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

**ක්‍රියාවලී පිරියත** (ලකුණු 1)

**නිෂ්පාදන ක්‍රියාවලියේ එක් අදියරසම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු දේ එක් ස්ථානයක සිදුවන ආකාරයට පිරියත පිළියෙල කිරීම ක්‍රියාවලි පිරියත ලෙස හැඳින්විය හැකිය.**

(ල. 02)

II අ) නිෂ්පාදනයේ ඵලදායිතාව හා කාර්යක්‍ෂමතාව මනීමට යොදාගත හැකි වැදගත් මිනුමක් ලෙස ඵලදායිතාවයේ වැදගත්කම සමීරට පහදා දෙන්න.

**ආයතනයක සඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ අගයකින් අත් කරගන්නා විට ඵලදායීතාවය ඉහළ අගයක් ගනියි.එනම් අනුලෝම සම්බන්ධතාවයක් පවතී එසේම නිවැරදි දේ නිවැරදි අයුරින් සිදුවන්නේ නම් ආයතනයේ ඵලදායිකත්වය ද නිතැතින්ම ඉහළ අගයක් ගනියි.**

(ල. 02)

ආ) සිය නිෂ්පාදන කටයුතු සඳහා නව තාක්‍ෂණය යොදා ගැනීමෙන් සමීරට අතවන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

- **නාස්තිය අවම වීම**
- **නව නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දිය හැකිවීම**

- නිෂ්පාදනවල ගුණාත්වය ඉහළ යාම
- කාර්යක්ෂමතාව ඉහළ යාම
- සේවකයින් අඩු ප්‍රමාණයක් යොදාගත හැකිවීම
- හිතකර වැඩ පරිසරයක් නිර්මාණය වීම
- නිෂ්පාදන ධාරිතාව වැඩි වීම
- මහා පරිමාණ නිෂ්පාදන පිරිමැසුම් වාසි ලබාගත හැකිවීම

(ල. 02)

III "ගනෙෂ් සහ පුත්‍රයෝ" ව්‍යාපාරය සිය ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය සඳහා විවිධ මාධ්‍ය භාවිතා කරයි. එනම් රූපවාහිනී, දැන්වීම් පුවරු, සමාජ මාධ්‍ය ජාල, එමෙන්ම ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ද මෙම ව්‍යාපාරය පිළිබඳ යහපත් අදහස ප්‍රචලිත කරයි.

අ) මෙම ව්‍යාපාරය භාවිතා කර ඇති ගෙවන ලද, උපයන ලද හා අයිතිකරගන්නා ලද මාධ්‍ය වෙන වෙනම සඳහන් කරන්න.

ගෙවන ලද - රූපවාහිනී,දැන්වීම් පුවරු

අයිති කර ගන්නාලද - සමාජ මාධ්‍ය ජාලා,ගනුදෙනුකරුවන්

උපයා ගන්නා ලද - ව්‍යාපාරය පිළිබඳ යහපත් අදහස් ප්‍රචලිත කිරීම

(ල. 02)

ආ) අලෙවිකරණය ආර්ථිකයට වැදගත් වන ආකාරය කරුණු හතරකින් දක්වන්න.

- නිෂ්පාදන විවිධාංගිකරණය ඇතිවීම
- නිෂ්පාදනය පුළුල්වීම
- සේවා නියුක්තිය ඉහළ යාම
- ආදායම් බෙදී යාමේ විෂමතාවය අවම වීම
- රටේ ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට මඟ පෑදීම

(ල. 02)

IV අලෙවිකරණයේ ජයග්‍රහණය වනුයේ යම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ වෙළඳපලෙහි ස්ථාපිත වීමයි.

අ) වෙළඳපලෙහි ස්ථාපිත විය හැකි ආකාර දෙකක් පහැදිලි කරන්න.

- භාණ්ඩය තුළ විවිධ ගුණාංග හා ප්‍රයෝජන ඇතුළත් කිරීම
- තරගකරුවන්ට සාපේක්ෂව වඩා ඉහළ සේවාවක් ලබාදීම
- විවිධ ප්‍රවර්ධන ක්‍රම භාවිතා කරමින් ගනුදෙනුකරුවන්ගේ මනස තුළින් භාණ්ඩ හෝ සේවාව හෝ ගැඹුරින් තැන්පත් කිරීම

(ල. 02)

ආ) වෙළඳපල කණ්ඩනයක් සඵලදායි වීම සඳහා තිබිය යුතු අවශ්‍යතා සඳහන් කරන්න.

- **මැනිය හැකි බව**
- **ළඟා විය හැකි බව**
- **ප්‍රමාණවත් බව**
- **වෙන්කොට හඳුනාගත හැකි බව**
- **ක්‍රියාත්මක කළ හැකි බව**

(කරුණු පහ/හතර - ලකුණු 2, කරුණු තුන/ දෙක - ලකුණු 1, කරුණු 1 - ලකුණු ½)

V අ) ගනුදෙනුකරු අපේක්ෂා කරන මට්ටමටත් වඩා ඉහළ මට්ටමක් සහිතව නිෂ්පාදිත වෙළඳපලට ඉදිරිපත් කරන්නේ කුමන නිෂ්පාදිත මට්ටමෙදී ද? ඒ සඳහා නිදසුනක් සපයන්න.

**වැඩිදියුණු කළ නිෂ්පාදිත .** (ලකුණු 1)

**කාබන් පෑනෙන් ලියන විට ප්‍රසන්න සුවඳක් වහනය වීම වැනි සුදුසු නිදසුනකට ලක්ණු දෙන්න.**

(ලකුණු 1)

ආ) ප්‍රවර්ධනයේ ඇති වැදගත්කම කරුණු හතරකින් පැහැදිලි කරන්න.

**ගුරු මාර්ග උපදේශයේ පිටු අංක 142 ට අනුව ලකුණු෴න්න**

(ල. 02)

(7) I අ) මූල්‍ය කළමනාකරණයේ දී කළමනාකරුවන් විසින් ගනු ලබන වැදගත් තීරණ වර්ග දෙක නම් කරන්න.

**මූල්‍ය තීරණ , ආයෝජන තීරණ**

(ල. 02)

ආ) මූල්‍ය සැලසුම්කරණ හා පාලන උපකරණයක් ලෙස අයවැයකරණයේ දී මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන සඳහන් කරන්න.

**ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 147 ට අනුව ලකුණු දෙන්න.**

(ල. 02)

II සමාගමක මූල්‍ය ප්‍රකාශනවල අඩංගුව තිබූ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

දළ ලාභය රු. 700000

විකුණුම් රු 1600000

අ) මෙම සමාගමේ දළ ලාභ අනුපාතය ගණනය කරන්න.

**දළ ලාභ අනුපාතිකය = $\frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$** (ලකුණු 1)

$$= \frac{700\ 000}{1600\ 000} \times 100$$

$$= 43.75\%$$ (ලකුණු 1)

(ල. 02)

ආ) දළ ලාභ අනුපාතය මගින් පෙන්නුම් කරන ප්‍රතිපත්තිය කුමක්ද?

**මිල ප්‍රතිපත්තිය**

(ල. 02)

III අ) ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළඳපල තුල ක්‍රියාත්මක වන මූල්‍ය උපකරණ හතරක් නම් කරන්න.

**භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, සාමාන්‍ය කොටස්, වරණීය කොටස්, වාණිජ පත්‍රිකා, තැන්පතු සහතික**

(ල. 02)

ආ) කොළඹ කොටස් වෙළඳපල ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත්වීමට හේතු හතරක් සඳහන් කරන්න.

**ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 179 ට අනුව ලකුණු ලබා දෙන්න**

(ල. 02)

IV අ) මානව සම්පත් කළමනාකරණයේ සුවිශේෂී අරමුණු හතරක් සඳහන් කරන්න.

**ගුරු මාර්ග උපදේශයේ පිටුඅංක 190 ට අනුව ලකුණු ලබාදෙන්න.**

(ල. 02)

ආ) මානව සම්පත් අවශ්‍යතා පුරෝකථනයේ දී අවධානය යොමුකළ යුතු සාධක හතරක් සඳහන් කරන්න.

- **භාණ්ඩ හෝ සේවාව සඳහා වූ ඉල්ලුම**
- **ආයතනයේ පරමාර්ථ**
- **නිෂ්පාදන ක්‍රමය**
- **අනාගත සේවක විශ්‍රාම යාම ඉල්ලා අස්වීම් උසස්වීම් ඉවත් කිරීම් සේවා නියුක්තිය අවසන් කිරීම**
- **ආයතනයේ වර්තමාන හා අනාගත මූල්‍ය තත්ත්වය**
- **ආර්ථික සමාජීය දේශපාලන හා නෛතික පරිසරය**

(ල. 02)

V අ) සේවක ආකර්ෂණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**ගුරු මාර්ග උපදේශයේ පිටු අංක 202 ට අනුව ලකුණු ලබාදෙන්න.**

(ල. 02)

ආ) සේවක පුහුණුව හා සංවර්ධනය අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

**ගුරු මාර්ග උපදේශයේ පිටුඅංක 216 ට අනුව ලකුණු ලබා දෙන්න.**

(ල. 02)

(8) I අ) දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්යයන් සඳහන් කරන්න.

- **වර්ගීකරණය**
- **තේරීම**
- **ගණනය කිරීම**
- **සාරාංශකරණය**

(ල. 02)

ආ) පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක උපාංග හයක් සඳහන් කරන්න.

**දෘඩාංග , මෘදුකාංග, ජීවාංග, දත්ත, ක්‍රියාපටිපාටිය, ස්පීරාංග**

(ල. 02)

II ආ) ඵලදායි තොරතුර පදධතියක් මගින් ඉටු කරගැනීමට අපේක්ෂිත කාර්යභාරයන් දෙකක් සඳහන් කරන්න.

**ගුරු මාර්ග උපදේශයේ පිටු අංක 246 ට අනුව ලකුණු ලබා දෙන්න**

(ල. 02)

ආ) භාවිතා කරන මට්ටම අනුව තොරතුරු පද්ධති වර්ගීකරණය කර දක්වන්න.

- **උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධති**
- **කළමනාකරණ මට්ටමේ තොරතුරු පද්ධති**
- **මෙහෙයුම් මට්ටමේ තොරතුරු පද්ධති**

(ල. 02)

III ආ) මෙහෙයුම් සැලැස්මේ අන්තර්ගතවිය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

- **ස්ථාවර වත්කම් අවශ්‍යතා**
- **අමුද්‍රව්‍ය අවශ්‍යතා**
- **සේවක අවශ්‍යතා**
- **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය**
- **කර්මාන්තශාලා බිම්සැලැස්ම**
- **අප ද්‍රව්‍ය බැහැර කිරීම**
- **සමාජයීය හා පාරිසරික බලපෑම්**
- **මූළ නිෂ්පාදන පිරිවැය හා ඒකක පිරිවැය**
- **ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර මෙහෙයුම් වියදම්**

(ල. 02)

ආ) මූල්‍ය සැලැස්මක අන්තර්ගත වන මෙහෙයුම් පෙර වියදම් යන්න උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර අවශ්‍ය වන වියදම් වේ.**

**නිදසුන් : ඉඩම් සංවර්ධනයට**

**ජල විදුලි පහසුකම් ලබා ගැනීමට**

**බලපත්‍ර ලබා ගැනීමට**

**ව්‍යාපාර ලියාපදිංචි කිරීමට**

(ල. 02)

VI අ) මූල්‍ය නොවන වාර්තා විශ්ලේෂණය සඳහා භාවිතා කරන මිනුම් දඬු දෙකක් සඳහන් කරන්න.

- සමාජ වගකීම් ඉටු කරන්නේද
- අපේක්ෂිත ව්‍යාපාරයට අවශ්‍ය අමුද්‍රව්‍යතිබෙනවාද
- ඒවා අවශ්‍ය වේලාවට අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා ගැනීමට හැකිද

(ල. 02)

ආ) විධායක සාරාංශයක වැදගත්කම කරුණු දෙකකින් පැහැදිලි කරන්න.

(ල. 02)

V අ) ව්‍යාපෘති සාරාංශය යන්න පැහැදිලි කරන්න.

**ඇස්තමේන්තුගත පිරිවැය, ආදායම් ප්‍රකාශනය,මුදල් ප්‍රවාහ ප්‍රකාශය , ණය ආපසු ගෙවීමේ සටහන, ඇස්තමේන්තු ගත්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ආදිය දැක්වෙන තොරතුරුවල සාරාංශගත ලේඛනය**

(ල. 02)

ආ) ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන විට විශේෂ සැලකිල්ලක් යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

**ගුරු මාර්ග උපදේශයේ පිටු අංක 207 ට අනුව ලකුණු ලබා දෙන්න.**

(ල. 02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub